RARE

# ජාතික සංවර්ධනය සහ ශ්‍රී ලංකාවේ පෞද්ගලික ගුවන්විදුලි නාලිකා

ශ්‍රී ලංකාවේ පෞද්ගලික සිංහල මාධ්‍ය ගුවන්විදුලි නාලිකා පහකට (5) විශේෂිතව කරනු ලබන අධ්‍යයනයකි.

කේ.පී.එස්.ඩබ්. කුමාර
FG/MACO/MC/09/014

ප්‍රවේශ අංකය: 1252
වර්ග අංකය:

සමාජීය විද්‍යාපති උපාධියෙහි අවශ්‍යතාවයක් පූරණය කරනු පිණිස කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.

මාර්තු 2015

# සාරාංශය

ජාතික සංවර්ධනය උදෙසා ශ්‍රී ලංකාවේ පෞද්ගලික ගුවන්විදුලි නාලිකා කොපමණ දුරට දායක වනවා ද යන විමසීම අධ්‍යයනයේ ප්‍රමුඛ අරමුණක් විය. මෙහි පවතින ඌන පැතිකඩවල් හඳුනාගනිමින් ඒවා අවම කිරීමත් ඒ ඔස්සේ ජාතික සංවර්ධනය සඳහා පුළුල් කතිකාවක් පෞද්ගලික ගුවන්විදුලි මාධ්‍ය ආයතන තුළ ගොඩනැගීම මෙහි අභිමතය විය.

මෙම පර්යේෂණය සිදු කිරීමේදී විශේෂයෙන් ශ්‍රාවක ප්‍රතිචාර මතම පෞද්ගලික ගුවන්විදුලි නාලිකා පහක් තෝරාගන්නා ලදී. එය පිළිවෙළින් ''හිරු එෆ්.එම්'', ''නෙත් එෆ්.එම්'', ''සිරස එෆ්.එම්'', ''වයි එෆ්.එම්'' හා ''බෞද්ධයා එෆ්.එම්'' වේ. ශ්‍රාවක ශ්‍රවණ පර්යේෂණයේදී විධිමත් ලෙස සකස් කරන ලද ප්‍රශ්නාවලී ක්‍රමයක් උපයෝගී කරගනිමින් දත්ත එක්රැස් කළ අතර, ඉහත ගුවන්විදුලි නාලිකා වැඩසටහන් අධ්‍යක්‍ෂවරුන් සමඟ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ අධ්‍යයනයට අදාළ තොරතුරු ලබාගන්නට විය.

ගුවන්විදුලි ශ්‍රාවකයන් වෙත ඉදිරිපත් කරන ලද ප්‍රශ්නාවලියේ දී ඔවුන් අසනු ලබන ගුවන්විදුලි වැඩසටහන් ස්වකීය අභිවෘද්ධිය උදෙසා බලපාන්නේ ද? ඒ කුමන අංශයක් ඔස්සේ ද? එකී වැඩසටහන් තුළ ජාතික සංවර්ධන ඉලක්ක ඔවුන් දකිනවා ද? යන්න මෙන්ම පවතින පෞද්ගලික ගුවන්විදුලි නාලිකා පිළිබඳ පවත්නා අදහස් ඉදිරිපත් කිරීම ද සිදු කරන ලදී.

ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි මාධ්‍ය ආයතන විශාල ප්‍රමාණයක් දැකගත හැකිය. මේ සියල්ල නිරීක්‍ෂණය කිරීම ප්‍රායෝගික නොවන්නා සේම අධ්‍යයන අරමුණු හා එළඹුම් ඉදිරිපත් කිරීමේදී එය සංකීර්ණ ස්වභාවයක් ඉසිලීමට ඉඩ ඇත. එබැවින් අධ්‍යයනයේදී ශ්‍රාවක ප්‍රතිචාර මත තෝරාගත් ගුවන්විදුලි නාලිකා පහට පමණක් මෙහිදී සීමා විය.

සමස්ථ ශ්‍රාවක දත්ත සලකා බැලීමේදී පැහැදිලිව තහවුරු වූයේ පෞද්ගලික ගුවන්විදුලි නාලිකා ශ්‍රවණය මගින් ශ්‍රාවකයන්ගේ පුද්ගල සංවර්ධනයට යම් පිටුබලයක් සපයන බවයි. එසේ වුවත් මෙම වැඩසටහන් ජාතික සංවර්ධනය ඇති කිරීමෙහිලා ප්‍රමාණවත් දායකත්වයක් නොදක්වන බව ශ්‍රාවක අදහස වී ඇත. බොහෝ වැඩසටහන් හුදු විනෝදය මුල් කරගත් ඒවා බව ඔවුන්ගේ අදහසයි.

එසේ හෙයින් හුදු විනෝදය වෙනුවට සංවර්ධනය වන රටක් ලෙස ගුවන් කාලය ඵලදායි අයුරින් භාවිත කරමින් රටේත් සමාජයේත් සංවර්ධනයක් ඇති කිරීමෙහි ලා නියමුවන් ලෙස ගුවන්විදුලි මාධ්‍ය පත් කිරීම කාලීන අවශ්‍යතාවක් ලෙස මෙහිදී සලකන්නට විය.

## මුඛ්‍ය පද

සංවර්ධනය, ජාතික සංවර්ධනය, ගුවන්විදුලිය, විකාශයවන ගුවන්විදුලි නාලිකා, නියැදිය

# Abstract

The major objective of the study is to discuss how far the private radio channels contribute for the national development. The main goal is to build a wide agreement in the private radio media institutes for the national development by identifying the minus profiles.

Specially, five private radio channels have been selected according to the Listeners responses, while conducting this experiment. They are Hiru F.M, Neth F.M, Sirasa F.M, Y F.M and Buddhist F.M data were collected using an effective questionnaire at the followers Listening experiment and information for the study were taken through the discussion with the directors of the above radio channels.

Do the radio channels which are listened by the followers affect for the self improvement according to the questionnaire? Do they (Perceive) the aims of national development through those programms? And, submitting the existent ideas on private radio channels were committed.

There are many radio channels in Sri Lanka. It is not practical to observe. All these and it can be complex when submitting objectives of the study and the outcomes. There fore only fiveradio channels have been selected according to followers responses.

When concerning all the data, it is proved that listening to radio channels is given a kind of setting for the personal development at the same time the followers say that there is not enough contribution from these channels in order to the national development most of the programmes are being conducted only for the entertainment.

There fore here, it is considered as a current necessity to constitute the radio channels as leaders to use the air time effectively to create the development of the country as well as the society insteacl of personal entertainment.

**Key word :-**

Development, National Development, Radio Board Casting Radio channel, Sample.